# 8. දේව කැමැත්ත ඉටු කරමු

**ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට පෙර සිදු වූ විශේෂ සිදුවීම් කීපයක් හා එම සිදුවීම් ඇසුරෙන් කිතුනුවන්ට ඉගෙන ගත හැකි පාඩම් පිළිබඳ ව සොයා බැලීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**ශු. මතෙව් 26: 26-30, ශු. ජොහාන් 13: 1-20, ශු. මතෙව් 26: 36-46**


ජේසුස් වහන්සේ ලොවේ පව් උදෙසා කුරුසියක තමන්ගේ ජීවිතය පූජා කිරීමට පෙර ඊට ආසන්නව සිදු වූ විශේෂ සිදුවීම් කිහිපයක් අතුරින් පහත සිද්ධීන් 3 ක් අපට ශුභාරංචිවලින් පැහැදිලි වෙයි.

- ✶ අන්තිම රාත්‍රි භෝජනය.
- ✶ ශ්‍රාවකයන්ගේ පාද සේදීම.
- ✶ ගෙත්සමනේ යාච්ඤාව.

මේ සිද්ධීන් තුනේ දී ම ශ්‍රාවකයන් හා ජේසුස් වහන්සේගේ සම්බන්ධතාව අපට මනාව පෙනී යයි.

දැන් අප එම සිදුවීම් දෙස අපගේ කල්පනාව යොමු කොට ඉන් අපගේ ජීවිතවලට අදාළ කර ගත හැකි ආදර්ශ හා ආත්මික මග පෙන්වීම් විමසා බලමු.

## 1. <u>අන්තිම රාත්‍රි භෝජනය</u>



## ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් සමඟ රාත්‍රි භෝජනය වැළඳීම



### රොටි ගෙන

(I) ආශිර්වාදය පැවසීම

(ii) කඩා ශ්‍රාවකයන්ට දීම

(iii) පැවසූ වචන -

**"ර්ගෙන වළඳන්න. මේ මාගේ ශරීරයයි."මතෙව් 26: 26**



### කුසලාන ගෙන

(I) තුති පිදීම

(ii) ශ්‍රාවකයන්ට බෙදා දීම

(iii) පැවසූ වචන -

**"ඔබ සියල්ලෝ ම මෙයින් පානය කරන්න.**
**මෙය පව් කමාව පිණිස බොහෝ දෙනකු උදෙසා වගුරුවන**
**මාගේ ගිවිසුම් රුධිරය වේ.**

ජේසුස් වහන්සේ කළ මෙම ක්‍රියාව තුළින් දෙවියන් වහන්සේ අපත් ජේසුස් වහන්සේ තුළින් සම්බන්ධ කරන නව ගිවිසුමක් පිහිටවූ සේක.

රොටී යනුවෙන් අදහස් කළේ ජේසුස් වහන්සේගේ ශරීරය යි. එම රොටිය කැඩීම යනු ජේසුස් වහන්සේගේ ශරීරය කුරුසියේ දී බිඳුණු ශරීරයක් බවට පත් වීම යි.

මිදි යුෂ යනුවෙන් අදහස් කළේ, කුරුසියේ දී ජේසුස් වහන්සේගේ ශරීරයෙන් ගැලූ රුධිරය යි. මෙම ක්‍රියාව උන් වහන්සේ මිනිසාගේ පාපයන් උදෙසා කළ පූජාව වෙයි.

මෙම නව ගිවිසුමට අප පංගුකරුවන් වී අප එම ක්‍රියාවට ඇතුළු වන විට අප උන් වහන්සේගේ ශරීරයේ හා රුධිරයේ කොටස් කරුවන් බවට පත් වෙයි. එහෙයින් උන් වහන්සේගේ ශරීරය හා රුධිරය වන රොටි හා මිදි යුෂ පිළිගැනීමට පෙර;

? උන් වහන්සේ අපගේ පාප උදෙසා කුරුසියේ දී පූජා වූ බව විශ්වාස කරමු.

? පාපවලට නිසි ලෙස පසුතැවෙමු.

සූදානමකින් එම ක්‍රියාවට සහභාගි වෙමු.

? පිරිසිදු සිතකින් ඒ සඳහා එක්වෙමු.

මෙම සහභාගිකත්වයට ඇතුළු වීමෙන්,

ක්‍රිස්තුස් වහන්සේ තුළ ස්ථිර ව දිවි ගෙවිය හැකි ය.

නිරතුරුව උන් වහන්සේ හා එක්විය හැකි ය.

සමීප ලෙස උන් වහන්සේ අත්දැකිය හැකි ය.

## 1. ශ්‍රාවකයන්ගේ පාද සේදීම.

අවසන් භෝජනයට පසු ජේසුස් වහන්සේ සිය උතුරු සළුව ගලවා පසෙක දමා, තුවායක් ඉණ වටේ දවටා ගත් සේක. ඉන්පසු දිය බඳුනක් ගෙන වත්කරලමින්, ශ්‍රාවකයන්ගේ පාද සේදීමටත්, ඉණ බැඳි තුවායෙන් ඒවා පිස දැමීමටත් පටන් ගත් සේක.




සීමොන් පේදුරු: ස්වාමිනි, ඔබ වහන්සේ මාගේ පාද සෝදන සේක් ද?

ජේසුස් වහන්සේ: මා කරන්නේ කුමක්දැයි ඔබ දැන් නො දන්නෙහි ය. එහෙත් පසුව ඔබට වැටහෙනු ඇත.

සීමොන් පේදුරු: "මා දිවි ඇතිතෙක් කවදාවත් මාගේ පාද සෝදන්ට නම් ඔබ වහන්සේට ඉඩ නො දෙමි."

ජේසුස් වහන්සේ: "මා ඔබ නොසේදුවොත් මා සමග සම්බන්ධකමක් ඔබට නැත.

සීමොන් පේදුරු: "ස්වාමිනි මාගේ පාද පමණක් නොව අත් ද හිස ද සේදුව මැනව."

ජේසුස් වහන්සේ: "ස්නානය කළ තැනැත්තේ මුළුමනින් ම පවිත්‍ර ය. එහෙත් හැම කෙනෙක් ම එසේ නොවෙති. හැම කෙනෙක් ම පවිත්‍ර නො වෙති."

පාද සෝදා අවසන් වූ ජේසුස් වහන්සේ සිය උතුරු සළුව යළි හැඳගත් පසු ශ්‍රාවකයන් අමතා මෙසේ කී සේක.

**"ඔබේ ස්වාමින් ද ගුරු දේවයන් ද වන මම**
**ඔබේ පාද සේදුවෙම් නම්,**
**ඔබත් එකිනෙකාගේ පාද සේදිය යුතු ය.**
**මා ඔබට කළාක් මෙන්**
**ඔබත් කළ යුතු බවට ආදර්ශයක් මම දුනිමි.**
**ජොහාන් 13: 15**

**මෙම ආදර්ශයෙන් ජේසුස් වහන්සේ අපට පෙන්වූයේ;**

නිහතමානීව සේවය කිරීමේ අගය,

- දෙවියන් වහන්සේ උස්පහත්කම් නොබලන බව.
- ස්වාමියා දාසයා කියා වෙනසක් උන්වහන්සේට නැති බව.
- තමන් අනෙක් තැනැත්තාට වඩා උසස් යයි නො සිතිය යුතු බව.

## 3. ගෙත්සෙමනේ යාච්ඤාව

උන් වහන්සේ තම ශ්‍රාවකයන් වන පේදුරු, ජාකොබ්, ජොහාන් කැටුව යෑම.

↓

එක් තැනක ඔවුන් රැඳවීම:

- උන්වහන්සේගේ සිත ශෝකයෙන් පිරී යෑම.

උන්වහන්සේ පැවසූ වචන
"මැරෙන තරමට මාගේ සිත අතිශයින් ම ශෝකාන්විත ය. ඔබ මෙහි නැවතී මා සමග අවදිව ඉන්න."

↓

ජේසුස් වහන්සේ යාච්ඤා කිරීමට පිටත්ව යෑම

මුනින් වැටී යාච්ඤා කිරීම

- යාච්ඤාව "පියාණෙනි, හැකි නම් මේ කුසලාන මා කෙරෙන් පහ කළ මැනව. එහෙත් මා කැමති ලෙස නොව, ඔබ කැමති ලෙස වේවා."

ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් වෙත නැවත පැමිණීම

නිදා සිටිනු දැකීම.

පේ‍්‍රගෝලයන්ට පැවසූ දේ -"මා සමඟ එක පැයක්වත් අවදි ව ඉන්න බැරි වුණා ද? ඔබ පරීක්ෂාවට නොවැටෙන පිණිස අවදිව සිට යාච්ඤා කරන්න. හිත කැමති ය ගත නම් දුබලය."

ජේසුස් වහන්සේ නැවත යාච්ඤා කරන්නට යෑම

යාච්ඤාව -
"පියාණෙනි, මේ කුසලාන පහ කළ නොහැකි නම්, ඔබගේ කැමැත්ත වේවා."

ජේසුස් වහන්සේ නැවත යාච්ඤා කරන්නට යෑම

යාච්ඤාව- එම වචන කියා යාච්ඤා කිරීම

නැවත ශ්‍රාවකයන් වෙත පැමිණීම

ශ්‍රාවකයන්ට පැවසූ දේ -
"නැගිටින්න අපි යමු, අන්න මා පාවා දෙන්නා අත ළඟ ය."

දුක් ප්‍රාප්තියට මුහුණ දීම තමාට නියමිත බව ජේසුස් වහන්සේ දැන සිටි සේක. උන් වහන්සේගේ සිත ශෝකයෙන් පිරී දුබල වුවද නිරන්තරයෙන් දේව කැමැත්තට භාර වූ සේක.

**එදිනෙදා ජීවිතයේ දී අපි,**

- අපට මුහුණ දෙන්නට තිබෙන ප්‍රශ්නවලදී පළමුව යාච්ඤාවට යොමු වෙමු.

- නිරතුරුව ම දේව කැමැත්ත කුමක්දැයි සිතා බලා එයට කීකරු ව කටයුතු කරමු.

✽ නිහතමානී ව අන් අයට ආදර්ශයක් දෙන ලෙස ජීවිතය ගොඩනගා ගනිමු.

✽ දිනපතා දෙවිඳුන් වෙත භාර වී, උන් වහන්සේගේ රැකවරණය තුළ ගමන් කරමු.

ජේසුස් වහන්සේ තම ජීවිතයේ දී, නොයෙකුත් අන්දමේ දුක් වේදනාවලට ගොදුරු වෙමින් ඊට මුහුණ දීම සඳහා ශක්තිය දෙවි පියාණන් වහන්සේගෙන් ලැබූ සේක. එසේ ම උන් වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද සේදීමෙන් ශ්‍රාවකයන්ට දේවරාජ්‍යයේ උතුම් ආදර්ශ සේවකයකු ලෙසින් දුන් සේක. මෙසේ දුක් ප්‍රාප්තියට පෙර අප සලකා බැලූ ඉහත සිදුවීම්වලින් ජේසුස් වහන්සේගේ ආදර්ශයන් කිතුනු අපගේ ද ආදර්ශය කර ගනිමු.

## ක්‍රියාකාරකම

**1.** ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට පෙර සිදු වූ විශේෂ සිදුවීම් අතුරෙන් ඔබ වඩාත් කැමති සිදුවීම පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

**2.** දුක් ප්‍රාප්තියට පෙර සිදුවූ සිදුවීම් මගින් උන්වහන්සේ ඉගැන්වූ විශේෂ කරුණු 5 ක් ලියා දක්වන්න.